ND PRAYER 21 DAYS OF FASTING AND PRAYER 21 DAYS OF



1-21 JAN

2023 DEVOTIONAL GUIDE

# WIDE-EYED WONDER

# දැස් විවර කර

දින 21 ක නිරාහාර කාලය තුළ අපට අපගේ බයිබල් කියවීම හා මෙනෙහි කිරීම තුළ දෙවිඳුන්ව පැහැදිලිව අවබෙ෴ධ කරගන්නටත්, දකින්නටත් පහසු වන ලෙස කාරණා සුදානම් කර තිබේ. මෙම දින 21 ක පුරා නිරාහාරව කාලය වෙන්කොට දෙවිඳුන්ව සොයන අතර තවදුරටත් එතුමන්ගේ බලය, ප්‍රඥාව, ආශ්චර්යමත් දේ අපට ලබාගත හැකිය අත්දැකිය හැකිය.

අපගේ එදිනෙදා ජීවිතයේ අභියෙ෴ග අමාරුකම් වලදී අප පසුබෑවත් උන්වහන්සේගේ උතුම් උසස්වු සිතුවිලි යෙ෴ජනා කල්පනා අප දකින අයහපතට වඩා යහපත දැකිය හැකිය. එලෙස යහපත ගැන දකින්න නොහැකි අවස්ථා පවා පරිවර්ථනය කොට දෙවිඳුන්ගේ බලය දකින්නට සලස්වන සේක.

අපගේ ජීවිත නැවුම් කරන බලය එතුමන්ගේ වචනය සතුවේ. මෙම නිරාහාර කාලය තුළ අපගේ ආත්මය ප්‍රාණය තුළ නැවුම්භාවයෙන් දේවල් දෙස බලන ආකාරයත් වෙනස් කොට නව අවුරුද්දට නැවුම්ව මුහුණ දෙන්නට හැකි වේ. එතුමන්ගේ නොවෙනස්වන පොරොන්දු තුළ අපට නව මඟක යා හැකිය. සැම සතියකම විවිධ පැතිකඩ වලින් දේව වචනය මෙනෙහි කරන්නට යන්නෙමු.

1 සතිය දෙවිඳුන් කෙරෙහි සාපිපාසය
2 සතිය මගේ හදවත වෙනස් කරන්න.
3 සතිය මගේ දැස් ඉදිරියේ තිබෙන
යහපත් දේ දකින්න විවර කරන්න.

මෙම දින 21 පුරා විවෘතව සිට දේව වචනය, යාච්ඤාව තුළ ගත කිරීමෙන් අපගේ ජීවිත වෙනස් වන්නටත්, දේව ගුණාංග තුළ වර්ධනය වෙමින් මහත් ආශිර්වාද ලබමු.

DAYS OF FASTING AND PRAYER 21 DAYS OF FASTING AND PRAYER 21 DAYS OF FASTING AND PRAYER 21 DAYS OF FASTING AND PRAYER 21 DAYS OF FASTING AND PRAYER

1 දවස

# නව බොහෙ◌ෝ තිබේ

1කොරින්ති 2:9-10,

තවද මේ නිසා මා ලියුවෙත් සියල්ලෙහිදී නුඹලා කීකරුව සිටිනවාද කියා සොදිසිකර දැනගන්නා පිණිසය. ,නුඹලා යමෙකුට යමක් ගැන කමාවෙනවා නම් මමත් කමාවෙමී. මම යමක් ගැන කමාවීම් නම්, එසේ කමාවී තිබෙන්නේ සාතන් අප කෙරෙහි වාසි නොලබන පිණිසය.

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

2 දවස

# දෙවිඳුනි ඔබව දකින්න ආශා වෙමි

ලුක් 18:40-41,
යේසුස්වහන්සේ නැවතී සිට ඔහු තමන් ළඟට ගෙනෙන්ට අණකළ සේක. ඔහු ළඟට ආ කල,
,මා විසින් නුඹට කුමක් කරනවාට නුඹ කැමැත්තෙහිදැයි ඔහුගෙන් ඇසුසේක. ස්වාමිනී,මට පෙනීම ලැබේවායි ඔහු කීවේය.

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

3 දවස

# කොර පොතු ඉවත් කරන්න

ක්‍රියා 9:12, "මක්නිසාද ඔහු යාච්ඤාකරමින් සිටිනුයේ, තමාට පෙනීම ලැබෙන පිණිස අනනියස් නම් මනුෂ්‍යයෙක් පැමිණ තමා පිට අත් තබනවා දුටුවේයයි කීසේක."

ක්‍රියා 9:18 "එකෙණෙහිම ඔහුගේ ඇස්වලින් කොරපොතු වැන්නක් වැටී, ඔහු පෙනීම ලැබුවේය;"

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

4 දවස

# දැස් විවර විය

2රාජාවලිය 6: 16, 17 "ඔහුද: භයනොවන්න. මක්නිසාද ඔවුන් සමඟ සිටින්නන්ට වඩා අප සමඟ සිටින්නෙ◌ෝ බොහෙ◌ෝයයි කීවේය. "එවිට එලිෂා යාච්ඤාකොට: ස්වාමීන්වහන්ස, දකින පිණිස මොහුගේ ඇස් පැහැදුවමැනවයි කීවේය. ස්වාමීන්වහන්සේ තරුණයාගේ ඇස් පැහැදූසේක. එවිට එලිෂා වටේට ගිනි අශ්වයන්ගෙන්ද ගිනි රථවලින්ද කන්ද පිරී තිබෙන බව ඔහු දුටුවේය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

5 දවස

# පැහැදිලි තේරුම් ගැනීම

යෙරමියා 1:11,12, "තවද ස්වාමීන්වහන්සේගේ වචනය මා වෙතට පැමිණ: යෙරෙමියා නුඹට පෙනෙන්නේ කුමක්දැයි ඇසීය. මමද: කොට්ටම්බා අත්තක් මට පෙනේයයි කීමි." "එවිට ස්වාමීන්වහන්සේ: නුඹට පෙනුණා හරිය. මක්නිසාද මාගේ වචනය ඉෂ්ටකරන පිණිස මම ඒ ගැන පිබිද සිටිමියි මට කීසේක."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

6 දවස

# ස්වර්ගීය ප්‍රමුඛතා

යාකොබ් 1:5- 8, "නුමුත් නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩු නම්, වරද නොතබන්නාවූ, බොහෝ කොට සියල්ලන්ට දෙන්නාවූ දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා; එවිට ඔහුට එය දෙනු ලැබේ."

6 දවස

# ස්වර්ගීය ප්‍රමුඛතා

"නුමුත් අනුමාන නොකරම ඇදහිල්ලෙන් ඉල්ලාවා. මක්නිසාද අනුමානකරන්නා සුළඟින් ගෙනයන්නාවූ, සෙලවෙන්නාවූ මුහුදේ රැළට සමානය." "එබැවින් එබඳු මනුෂ්‍යයා තමාට ස්වාමීන්වහන්සේගෙන් යමක් ලැබේයයි නොසිතාවා." ඔහු දෙසිත් ඇති මනුෂ්‍යයෙක්ව, තමාගේ සියලු මාර්ගවලදී අස්ථිරව සිටින්නේය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

## 7 දවස

# අදාළ කර ගැනීම

ගීතාවලිය 107:9, "මක්නිසාද උන්වහන්සේ පිපාසිතයා තෘප්තියට පමුණුවා, ක්ෂුධා ඇත්තා යහපතින් පිනවනසේක."

මතෙව් 5:6, "ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාදලද්දෝය; මක්නිසාද ඔව්හු තෘප්තියට පැමිණෙන්නෝය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

- පසුගිය සතියේ සාරාංශය වෙත අවධානය දෙන්න.
- අදාළ කර ගත යුතු කාරණා පෙන්වා දී තිබෙන දේ ගැන යාච්ඤා කරන්න.
- සභාව උදෙසා යාච්ඤා කරන්න.

8 දවස

# අපගේ හදවත පෙන්වන්න

යෙසායා 6:1 -5, "උස්සියා රජු
නැසුණු අවුරුද්දේදී
ස්වාමීන්වහන්සේ උස්වූ උසස්වූ
සිංහාසනයක වැඩ හිඳිනවා දුටිමි.
උන්වහන්සේගේ වස්ත්‍ර කෙළවරින්
මාළිගාව පිරී තිබුණේය."

8 දවස

# අපගේ හදවත පෙන්වන්න

"උන්වහන්සේ අවටින් සෙරාප්වරු සිටියෙ◌ෝය. එක් එක්කෙනාට පියාපත් හය බැගින් තිබුණේය; දෙකකින් මුහුණ වසාගත්තේය, දෙකකින් පාද වසාගත්තේය, දෙකකින් පියාසර කෙළේය.“ "ඔව්හු එක්කෙනෙක් අනිකෙකුට මොරගසමින්: සේනාවල ස්වාමීන්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය, මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේයයි කීවෙ◌ෝය."

8 දවස

# අපගේ හදවත පෙන්වන්න

"එවිට මොරගැසූ තැනැත්තාගේ හඬට එළිපත්වල අත්තිවාරම් සෙලවුණේය, ගෘහයද දුමෙන් පිරුණේය." "එවිට මම කථාකොට: අහෝ! මට දුක්වේ! මක්නිසාද මට විනාශය විය; කුමක් හෙයින්ද අපවිත්‍ර තොල් ඇති මනුෂ්‍යයෙක්ව සිටින්නාවූ, අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතරේ වසන්නාවූ මම සේනාවල ස්වාමිවූ රජ්ජුරුවන්වහන්සේ මාගේ ඇස්වලින් දුටුවෙමියි කීමි."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

9 දවස

# අපට නිසි මඟ පෙන්වන්න

යෙසායා 55:8, "මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය, නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේයයි ස්වාමීන්වහන්සේ කියනසේක.“

හිතෝපදේශ 14:12, "මනුෂ්‍යයෙකුට හරිව පෙනෙන මාර්ගයක් ඇත; එහෙත් එහි කෙළවරෙහි මරණයේ මාර්ග තිබේ."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

10 දවස

# ජීවනයේ මඟ පෙන්වන්න.

ගීතාවලිය 16:7-11, "මට දැනමිතිකම් දුන්නාවූ ස්වාමීන්ට ස්තුති ප්‍රශංසාකරන්නෙමි; එසේය, රාත්‍රි භාගයෙහිදී මාගේ සිතිවිලිවලින් මට ගුරුකම් ලැබේ." "ස්වාමීන් නිතර මා ඉදිරියෙහි තබාගතිමි. උන්වහන්සේ මාගේ දකුණු පැත්තෙහි සිටින බැවින් මම නොසෙල්වන්නෙමි."

10 දවස

# අපට නිසි මඟ පෙන්වන්න

"එබැවින් මාගේ සිත සන්තෝෂවේ, මාගේ ගෞරවය ප්‍රීතියෙන් පිනයි. මාගේ මාංසයද සුරැකිව වසන්නේය." "මක්නිසාද ඔබ මාගේ ආත්මය ෂෙයෝලෙහි තිබෙන්ට නාරිනසේක; ඔබගේ ශුද්ධ තැනැත්තාට කුණුවීම දකින්ට නොදෙනසේක." "ඔබ මට ජීවන මාර්ගය දක්වනසේක. ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය; ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම සැපත ඇත්තේය."

10 දවස

# අපට නිසි මඟ පෙන්වන්න

යොහන්14: 6, "යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: මාර්ගයද සැබෑවද ජීවනයද මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත,"

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

11 දවස

# මනසේ ගැටුම්, පොරබැදීම්

2කොරින්ති 10:3-6, "මක්නිසාද අපි මාංසයෙහි හැසිරෙන නුමුත් මාංසයේ හැටියට යුද්ධ නොකරමුව." "(මක්නිසාද අපේ යුද්ධායුධ මාංසික නොවේය, එහෙත් ඒවා බලකොටු බිඳහෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය.)"

11 දවස

# මනසේ ගැටුම්, පොරබැදීම්

"අපි විවාදයන්ද දෙවියන්වහන්සේ ගැන දැනගැනීමට විරුද්ධව උසස්වන්නාවූ සියලු උසස් දේවල්ද බිඳහෙළා, සියලු සිතිවිලි ක්‍රිස්තුස්වහන්සේට කීකරුවීමට වහල්කරදෙමුව." "නුඹලාගේ කීකරුකම සම්පූර්ණවූ කල සියලු අකීකරුකමට දඬුවම්කිරීමටද අපි සූදානම්ව සිටිමුව."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

12 දවස

# සියළුම තැන්හී විවෘත දොරටු

එළිදරව් 3: 8, "එනම්: මම නුඹේ ක්‍රියා දනිමි, (මෙන්න, කිසිවෙකුට පියන්ට බැරිවූ ඇරපු දොරක් නුඹ ඉදිරියෙහි මා විසින් තබා තිබේ.) නුඹට ඇත්තේ ස්වල්ප බලයක්ය. නුඹ මාගේ වචන රක්ෂාකෙළෙහිය, මාගේ නාමය නුඹ එපාකළේ නැත."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

13 දවස

# ජය ගන්න ඇදහිල්ල

මාර්ක් 2: 2-5, "එවිට දොරකඩ ළඟවත් ඉඩ නැති තරමට බොහෝ දෙනෙක් රැස්වූවෝය. උන්වහන්සේ ඔවුන්ට වචනය කීසේක." "එකල සතරදෙනෙකු විසින් උසුලනලද අංශභාග රෝගියෙකු රැගෙන ඔව්හු උන්වහන්සේ වෙතට ආවෝය."

13 දවස

# ජය ගන්න ඇදහිල්ල

"සමූහයා නිසා උන්වහන්සේ ළඟට එන්ට නොහැකිව, ඔව්හු උන්වහන්සේ සිටි තැන සෙවිල්ල හැර, පියස්ස කඩා, අංශභාග රෝගියා ඔත් යහන බැස්සෙවුවෝය."

"යේසුස්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල දැක: පුත්‍රය, නුඹේ පව් කමාකරනලදැයි අංශභාග රෝගියාට කීසේක."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

14 දවස

# අදාළ කර ගනීමු

යෙරමියා 17:10,
"ස්වාමීන්වහන්සේ වන මම
එකිනෙකාට තම තමාගේ මාර්ග
ලෙසද ක්‍රියාවල ඵල ලෙසද දෙන
පිණිස සිත විභාගකොට, අදහස්
සෙෝදිසිකරමි.“

හිතෙෝපදේශ 4: 23,
"සියල්ලටම වඩා නුඹේ සිත
ආරක්ෂාකරගන්න;  මක්නිසාද
එයින් ජීවනය නික්මෙන්නේය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

- පසුගිය සතියේ සාරාංශය දෙස බලන්න.
- දෙවිඳුන් පෙන්වන දේ දෙස අවධානය යොමු කරන්න.
- ඒ ගැන යාච්ඤා කරමු.

15 දවස

# දෙවිඳුන්ගේ විශ්වාසවන්තකම

යෙෝෂුවා 23:14, "බලව, අද
මම මුළු පොළොවේ සියල්ලන් යන
මාර්ගයේ යමි. නුඹලාගේ දෙවිවූ
ස්වාමීන්වහන්සේ නුඹලා ගැන කී
සියලු යහපත් දේවලින් එක
දෙයක්වත් අත්නෑරුණු බව
නුඹලාගේ මුළු සිතෙනුත් මුළු
ආත්මයෙනුත් නුඹලා දන්නහුය;
එයින් එක දෙයක්වත් අත්නෑරී
සියල්ලම නුඹලාට පැමුණුණේය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

16 දවස

# දෙවිඳුන්ගේ යහපත්කම

ගීතාවලිය 34: 8- 10, "ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්. උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන මනුෂ්‍යයා ආශීර්වාදලද්දේය." "ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි, උන්වහන්සේට භයවව්. මක්නිසාද උන්වහන්සේට භයවන්නන්ට කිසි හිඟයක් නැත."

16 දවස

# දෙවිඳුන්ගේ යහපත්කම

"තරුණ සිංහයෝ හිඟ ඇතිව සාගින්න විඳිති. නුමුත් ස්වාමීන් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් හිඟයක් නොවන්නේය.

ගීතාවලිය 27: 13, "ජීවතුන්ගේ දේශයෙහි ස්වාමීන්ගේ යහපත්කම දකින්ට ලැබේයයි නොඇදහුවෙම් නම් කොපමණ අසරණද?"

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

17 දවස

# දෙවිඳුන්ගේ ආශිර්වාදය භුක්ති විඳිමු.

ගීතාවලිය 69:19, "ඔබ මාගේ නින්දාවද ලජ්ජාවද අවනම්බුවද දන්නාසේක. මාගේ සියලු එදිරිකාරයෙෝ ඔබ ඉදිරියෙහිය.“

ගීතාවලිය 103: 2-5, "මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල සිහිනැති නොකරව."

17 දවස

# දෙවිඳුන්ගේ ආශිර්වාදය භුක්ති විඳිමු.

"උන්වහන්සේ නුඹේ සියලු
අයුතුකම් කමාකරනසේක; නුඹේ
සියලු රෙ◌ෝග සුවකරනසේක;"
"නුඹේ ජීවිතය විනාශයෙන් මුදා
කරුණාගුණය හා දයාව නමැති
ඔටුන්නෙන් නුඹ සරසනසේක."
"රාජාලියෙකු මෙන් නුඹගේ
යෞවනකම අලුත්වන පිණිස
උන්වහන්සේ නුඹගේ කට යහපත්
දෙයින් තෘප්තියට
පමුණුවනසේක."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

18 දවස

# දෙවිඳුන්ගේ බලය අත්දැකිමු

මතෙව් 8: 23 -27, "උන්වහන්සේ
ඔරුවකට නැගුණු කල
ගෝලයෝ උන්වහන්සේ
අනුව ගියෝය."  "බලව, ඔරුව
රැළවලින් වැසී යන තරම් මුහුදේ
මහත් කුණාටුවක් විය.
උන්වහන්සේ නිදා හුන්සේක."
"එවිට ඔව්හු උන්වහන්සේ ළඟට
ඇවිත් උන්වහන්සේ පුබුදුවා:
ස්වාමිනි, අප ගැළවුව මැනව; අපි
විනාශවෙමුයයි කීවෝය."

18 දවස

# දෙවිඳුන්ගේ බලය අත්දැකිමු

"උන්වහන්සේද: මඳ ඇදහිල්ල ඇත්තෙනි, කුමක් නිසා භයපත්වන්නේදැයි ඔවුන්ට කියා, නැගිට හුළඟටත් මුහුදටත් සැරකළසේක; එවිට මහත් නිශ්චලයක් විය." "ඒ මනුෂ්‍යයෝ මවිතව: මුන්වහන්සේ කෙබඳු කෙනෙක්ද? හුළඟ හා මුහුද පවා උන්වහන්සේට කීකරුවෙනවායයි කීවෝය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

19 දවස

# දෙවිඳුන්ගේ අස්වැන්න දකිමු

යොහන් 4:35-36, "තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි- නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලන්න."
"වපුරන්නාත් කපන්නාත් එක්ව සන්තෙ◌ෝෂවන පිණිස, කපන්නා කුලී ලැබ සදාකාල ජීවනයට අස්වැන්න එකතුකරගන්නේය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

20 දවස

# දෙවිඳුන්ගේ අනුග්‍රහය දෙස බලමු

එපීස 1:18-19, "උන්වහන්සේගේ කැඳවීමේ බලාපොරොත්තුව කිමෙක්ද කියාත්, ශුද්ධවන්තයන් තුළවූ උන්වහන්සේගේ උරුමයේ මහිමයේ සම්පත කිමෙක්ද කියාත්," "අදහන්නාවූ අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, නුඹලා දැනගන්න පිණිස නුඹලාගේ සිත් නැමති ඇස් පහදන ලෙසත්ය."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

21 දවස

# අදාළ කර ගැනීම

යෙරමියා 29:11, "මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි, නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සාමාදානයේ යෝජනායයි ස්වාමීන්වහන්සේ කියනසේක.“

යෙරමියා 33:3, "මට යාච්ඤාකරන්න, එවිට මම නුඹට උත්තරදී, නුඹ නොදන්න මහත්වූ අමාරු දේ නුඹට පෙන්වන්නෙමි."

ජීවමාන වචනය :-

විමසන්න :-

තමන්ට අදාළ කර ගැනීම :-

යාච්ඤාව :-

- පසුගිය සතියේ සාරාංශය වෙත අවධානය යොමු කරන්න.
- දෙවිඳුන් පෙන්වූ දේ ගැන යාච්ඤා කරන්න.
- දවස්පතා යාච්ඤාවෙන් මෙනෙහි කිරීමෙන් වසර පුරා ගමන් කරන්න සිත යොමු කරමු.